# බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත**

**කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප.)**
**4 -ඒ , 1/1, සෝරත මාවත ,ගංගොඩවිල, නුගේගොඩ.**
**දුරකථන : 011-5515570 ෆැක්ස්: 011-2804505**
**E-mail : idawp@sltnet.lk web : ida.wp.gov.lk**

# කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප)

## පටුන


**1.** හැදින්වීම **01**

**1.1** දැක්ම
**1.2** මෙහෙවර
**1.3** කාර්යභාරය

**2.** සංවිධාන සටහන **02**

**3.** කාර්ය මණ්ඩල විස්තර **03**

**4.** රැකියා විස්තර **04 - 07**

**5.** ආයතයේ නිලධාරීන්ගේ විස්තර , ලිපිනයන් හා දුරකතන අංක **08**

**6.** අදාල වන සියලු ප්‍රඥප්ති හා අණ පනත් **09**

**6.1 1994** අංක **02** දරණ බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය **10 - 21**

**7.** ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන්, ව්‍යාපෘති **22 - 33**

**8.** අත්කරගත් ජයග්‍රහණයන් **34**

**9.** හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් **34**

**10. 2020** ක්‍රියාත්මක කිරිමට යෝජිත ව්‍යාපෘති **35**

# බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය

## 1. හැඳින්වීම

පළාතේ කර්මාන්ත ප්‍රවර්ධනය, සංවර්ධනය, ව්‍යාප්තිය සහ දිරිගැන්වීම හා සංවර්ධනය සඳහා 1994 අංක 02 දරණ බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය මඟින් බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇති අතර වර්ථමානයේ **බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.**

### 1.1 <u>දැක්ම</u>

බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධනයේ ප්‍රමුඛතම සේවා සම්පාදකයා වීම


### 1.2 <u>මෙහෙවර</u>

පළාතේ ව්‍යවසායකයින් දිරිගන්වමින් හා ශක්තිමත් කරමින් කර්මාන්ත ක්ෂේත්‍රයට ඇතුලත් වීමට ඉඩකඩ විවර කර දීමත්, පළාතේ සම්පත් උපයෝගී කර ගනිමින් සහ නව තාක්ෂණය හඳුන්වා දෙමින් දැනට කර්මාන්ත වල නියැලෙන හා අළුතින් කර්මාන්ත ඇරඹීමට අපේක්ෂා කරන පිරිස් වල දැනුම හා කුසලතා වර්ධනය කරමින් සහ ව්‍යවසායකයන්ගේ ආකල්ප වර්ධනය කරමින් පළාතේ කර්මාන්ත සංවර්ධනයට සහය වීමත්, ඒ හරහා ව්‍යාපාරිකයන්ගේ ආදායම වර්ධනය කරමින් ජාතික සංවර්ධනයට දායක වීමත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මෙහෙවර වන්නේය.

### <u>1.3 කාර්යයන්</u>

1. ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.
2. පළාත තුල කර්මාන්ත දිරි ගැන්වීම හා ඊට ආධාර දීම.
3. කර්මාන්ත ව්‍යාපෘති ඇති කිරීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන් පළාතට ගෙන්වා ගැනීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම මාර්ගයෙන් මෙම ආයෝජකයන්ට ආධාර දීම.
4. අයෝජනය සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැලැස්වීම ඇතුළුව ඒ සඳහා අවශ්‍ය වන සතුටුදායක පරිසරයක් නිර්මාණය කිරීම.
5. පළාත තුල කර්මාන්ත වල නියැලී සිටින අය සඳහා අවශ්‍ය උපදෙස් දීම ඇතුළුව කර්මාන්ත වලට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම සහ අවශ්‍ය පුහුණුව හා අධ්‍යාපනය ලබා දීම හා අවශ්‍ය පර්යේෂණ පැවැත්වීම.
6. පළාත තුල විවිධ කර්මාන්තකරුවන් අතර සුහදතාවය පවත්වාගෙන යෑම.
7. දේශීය වශයෙන් නිපදවනු ලබන භාණ්ඩ සඳහා පළාත තුල වෙළඳපොල ඇති කිරීම හා එබඳු භාණ්ඩ නිෂ්පාදනය උනන්දු කරවීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස අභ්‍යන්තර ගිවිසුම් සඳහා විධිවිධාන සැලැස්වීම.
8. දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ අලෙවි කිරීම පිණිස අවශ්‍ය සහය සහ උපදෙස් ලබා දීම.
9. මෙම අංශය සංවර්ධනය කිරීම පිණිස අවශ්‍ය මුදල් ලබා ගැනීම, තරග හා තෑගි බෙදා දීමේ උත්සව පැවැත්වීම සහ සහතික නිකුත් කිරීම පිළිබඳ මග පෙන්වීම.
10. මෙම ප්‍රඥප්තියෙහි පරමාර්ථ වලට අදාලව වෙනත් කටයුතු වල නිරත වීම.
11. අමාත්‍යවරයාගේ මතයට අනුව අධිකාරිය විසින් භාරගත යුතු වන වෙනත් සම්බන්ධිත කටයුතු වල නිරත වීම.

## 2. සංවිධාන සටහන/ව්‍යුහය



## 3. කාර්ය මණ්ඩල විස්තරය

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක | ජ්‍යේෂ්ඨ කළමනාකරණ | 01 | 01 |
| 02. | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | මධ්‍යම කළමනාකරණ | 01 | 01 |
| 03. | සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) | මධ්‍යම කළමනාකරණ | 01 | - |
| 04. | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති සහ සැලසුම්) | මධ්‍යම කළමනාකරණ | 01 | - |
| 05. | පරිපාලන නිලධාරී | කනිෂ්ඨ කළමනාකරණ | 01 | 01 |
| 06. | පුද්ගලික සහකාර | කනිෂ්ඨ කළමනාකරණ | 01 | 01 |
| 07. | කර්මාන්ත සංවර්ධන නිලධාරී | ද්විතීයන | 05 | 02 |
| 08. | කළමනාකරණ සහකාර (තාක්ෂණික/තාක්ෂණික නොවන) | ද්විතීයන | 13 | 11 |
| 09. | පරිගණක දෘඩාංග ශිල්පී කළමනාකරණ සහකාර (තාක්ෂණික) | ද්විතීයන | - | 01 |
| 10. | රියදුරු | ප්‍රාථමික | 02 | 02 |
| 11. | කාර්යාල කාර්යය සහායක | ප්‍රාථමික | 02 | 02 |
| | මුළු සේවක සංඛ්‍යාව | | 28 | 22 |

# 4. රැකියා විස්තර

| | |
|---|---|
| 4.1 තනතුරු නාමය<br><br>ගණය<br><br>වැටුප් පරිමාණය | අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක)<br><br>ජ්‍යෙෂ්ඨ විධායක<br><br>HM 1-1 2016<br><br>81,670-15*2,270 |
| රැකිය විස්තරය | බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය මගින් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත පැවරෙන මුඛ්‍ය කාර්යභාරයට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අධ්‍යක්ෂ මණ්ඩලය සමග සම්බන්ධීකරණ වෙමින් ක්‍රියාවට නැංවීම<br><br>බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අදාලව කලින් කලට පනවනු ලබන නිතිරිති, රෙගුලාසි වලට යටත්ව පරිපාලන, මූල්‍ය සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරවීම, අධික්ෂණය සහ පාලනය |
| 4.2 තනතුරු නාමය<br><br>ගණය<br><br><br><br>වැටුප් පරිමාණය | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)<br><br>කළමනාකරණ<br><br>MM 1-1 2016<br><br>53,175-10*1,375-15*1,910 |
| රැකියා විස්තරය | මූල්‍ය නීතිරීති අනුව මූල්‍ය පරිපාටිය හා පාලනය නිවැරදිව සිදුකිරීම, අධිකාරියේ අයවැය ලේඛණය සකස් කිරීම සහ වියදම් පාලනය, ගබඩා පාලනය සහ අධීක්ෂණය, ටෙන්ඩර් පරිපාටිය අනුව කටයුතු කිරීම සහ මූල්‍ය හා මූල්‍ය පාලනය පිළිබඳ ඉහළ කළමනාකාරීත්වයට සහාය ලබාදීම. |
| 4.3 තනතුරු නාමය<br><br>ගණය<br><br>වැටුප් පරිමාණය | සහකාර අධ්‍යක්ෂ (කාර්මික)<br><br>කළමනාකරණ<br><br>MM 1-1 2016<br><br>53,175-10*1,375-15*1,910 |
| රැකියා විස්තරය | කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණික හා ඉංජිනේරු ක්ෂේත්‍ර සම්බන්ධ තොරතුරු, උපදෙස් සහ පුහුණු අවශ්‍යතා සම්පාදනය හා වාර්තා සම්පාදනය කිරිම, අධිකාරියේ සියළුම ඉංජිනේරු කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරිම සහ අදාල සැලසුම් සකස් කිරිම, කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වාර්ෂික සැලැස්ම සම්පාදනයේදි අවශය සහාය ලබාදීම. |
| 4.4 තනතුරු නාමය | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා සැලසුම්) |

| | |
|---|---|
| ගණය<br><br>වැටුප් පරිමාණය | කළමනාකරණ<br><br>MM 1-1 2016<br><br>53,175-10*1,375-15*1,910 |
| රැකියා විස්තරය | බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියේ දැක්වෙන අරමුණු ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යයන සිදු කිරීම, කෙටිකාලීන දිගුකාලීන හා මධ්‍ය කාලීන සැලසුම් ඇතුලත් සංයුක්ත සැලැස්ම සකස් කිරීම, ඊට අදාල ක්‍රියාකාරකම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම, සම්බන්ධීකරණය කිරීම සහ ව්‍යාපෘති වල ප්‍රගතිය අධීක්ෂනය කිරීමේ ක්‍රමවේද සකස් කිරීම සහ අධීක්ෂනය කිරීම. |
| 4.5 තනතුරු නාමය<br><br>ගණය<br><br>වැටුප් පරිමාණය | පරිපාලන නිලධාරි<br><br>කණිෂ්ඨ කළමනාකරණ<br>JM 1-1 2016<br>42,600-10*755-8*1,135 |
| රැකියා විස්තරය | ආයතනයෙහි අභ්‍යන්තර පරිපාලනය, කාර්ය මණ්ඩලය මෙහෙයවීම, අධීක්ෂණය සහ විනය පාලනය |
| 4.5 තනතුරු නාමය<br><br>ගණය<br><br>වැටුප් පරිමාණය | පුද්ගලික සහකාර<br><br>කණිෂ්ඨ කළමනාකරණ<br><br>JM 1-1 2016<br><br>42,600-10*755-8*1,135 |
| රැකියා විස්තරය | සභාපති අධ්‍යක්ෂ දෛනික රාජකාරි කටයුතු සඳහා අවශය ලිපි ලේඛණ සකස් කිරීම, කළමනාකරණ මණ්ඩල රැස්වීම් සහ ආයතනයෙහි පොදු සහ බාහිර රැස්වීම් සංවිධානය, වාර්තා සකස් කිරීම, සම්බන්ධීකරණ කටයුතු, කළමනාකරණ මණ්ඩල තීරණ පසුවිපරම් කිරීම. |
| 4.6 තනතුරු නාමය<br><br>ගණය<br><br>වැටුප් පරිමාණය | කර්මාන්ත සංවර්ධන නිලධාරී<br><br>ක්ෂේත්‍ර නිලධාරී<br><br>MA 3-1 2016<br>32,200-10*445-11*660 |
| රැකියා විස්තරය | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය සහ නව කර්මාන්ත, ස්වයංරැකියා ආරම්භ කිරීමට සහාය ලබාදීම, කර්මාන්ත සංවර්ධනය සඳහා සම්පත් අධ්‍යයනය සිදුකිරීම, ශක්‍යතා අධ්‍යයන වාර්තා, ව්‍යාපෘති යෝජනා, සැලසුම් සකස් කිරීම සහ අධිකාරියේ වාර්ෂික සැලැස්ම ක්‍රියාත්මක කිරීම. |
| 4.7 තනතුරු නාමය<br><br>ගණය<br><br>වැටුප් පරිමාණය | කළමනාකරණ සහකාර<br><br>කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)<br><br>MA 1-1 2016 |

| | |
|---|---|
| | 27,900-10*300-7*350-4*495-20*660 |
| රැකියා විස්තරය | ආයතනයේ කාර්ය පරිපාටි සංග්‍රහයට අනුකූලව පරිපාලනමය/මුල්‍යමය සහ සැලසුම් සහ සේවා කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශය වන වාර්තා තැබීම, සංඛ්‍යා ලේඛණ පවත්වාගෙන යාම, ලිපිගොණුකරණය, ආකෘති සම්පාදනය, සන්නිවේදනය සහ ප්‍රවාහන කටයුතු, මුදල් පාලන, මුදල් භාරකාරත්ව, ආදායම් හා ගෙවීම්, භාණ්ඩ සමීක්ෂණ, ගබඩාකරණය, ලිපිලේඛන යතුරු ලියනය හා පරිගණක කටයුතු ඉටු කිරීම. |
| 4.8 තනතුරු නාමය<br><br>ශ්‍රේණිය<br><br>වැටුප් පරිමාණය | කළමනාකරණ සහකාර (තාක්ෂණ)<br><br>කළමනාකරණ සහකාර (තාක්ෂණ)<br><br>MA 1-2 2016<br><br>27,900-10*300-7*350-4*495-20*660 |
| රැකියා විස්තරය | ආයතනයේ පරිගණක නඩත්තු සහ සේවා ඒකකයට අදාලව රාජකාරි කටයුතු පවත්වාගෙන යාම, පරිගණක සේවා සහ නඩත්තු කටයුතු සිදුකිරිම,ජාලගතකරණය, පද්ධති සංවර්ධනය, දත්ත ගබඩාකරණය, සන්නිවේදනය සහ ප්‍රවාහන කටයුතු, පරිගණක ඒකකයට අදාල උපකරණ ගබඩාකරණය සහ බෙදා හැරීම, |
| 4.9 තනතුරු නාමය<br><br>ශ්‍රේණිය<br><br>වැටුප් පරිමාණය | රියදුරු<br><br>ප්‍රාථමික - ශිල්පීය<br><br>PL 3 - 2016<br><br>26,290-10*270-10*300-10*330-12*350 |
| රැකියා විස්තරය | ආයතනයෙහි කළමනාකාරිත්වයේ උපදෙස් මත ආයතනයේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරිම සඳහා ආරක්ෂාකාරිව ආයතනයෙහි වාහන පැදවීම, මනාව නඩත්තු කිරීම, පවිත්‍ර කිරීම හා අළුත්වාඩියා කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සහ ධාවන සටහන් පොත් හා ඉන්ධන ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාම. |

| | |
|---|---|
| 4.10 තනතුරු නාමය<br><br>ශ්‍රේණිය<br><br>වැටුප් පරිමාණය | කාර්යාල කාර්ය සහායක<br><br>ප්‍රාථමික- ශිල්පීය නොවන<br><br>PL 1 - 2016<br><br>24,750-10*250-10*270-7*300-15*330 |

| | |
|---|---|
| රැකියා විස්තරය | කාර්යාල කටයුතු වලට සහාය වීම හා පිරිසිදු කිරීම, නියමිත පරිදි කාර්යාලීය යතුරු රාජකාරි ඉටුකිරීම, ආයතනය පිරිසිදුව හා ක්‍රමානුකූලව පවත්වාගෙන යාම, විදුලි උපකරණ නියමිත පරිදි පරිහරණය, බඩු බාහිරාදිය, ලිපිගොනු, ලිපිලේඛන රැගෙන යාම, ලේඛණ භාරකාරත්වය සහ පැවරෙන වෙනත් රාජකාරි. |

## **5.** නිලධාරීන්ගේ විස්තර, ලිපිනයන් හා දුරකථන අංක

| අනු අංකය | නම | තනතුර | කාර්යාලීය දුරකථන අංකය | ජංගම දුරකථන අංකය |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 01. | - | සභාපති | 011-4208772 | - |
| 02. | ඩී.පී.ප්‍රසන්න සුජිත් කුමාර මහතා | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක | 011-2804500 | 071-4343939 |
| 03. | කේ.සසීකරන් මහතා | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | 011-5515559 | 077-3114783 |
| 04. | - | සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) | 011-3182256 | - |
| 05. | - | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති සහ සැලසුම්) | 011-2804440 | - |
| 06. | චතුරි බ්‍රාහ්මණ මහත්මිය | පරිපාලන නිලධාරි (වැ.බ.) | 011-5515570 | 071-7060165 |
| 07. | ආර්.තරංග බමුණුසිංහ මහතා | කර්මාන්ත සංවර්ධන නිලධාරී | 011-2804511 | 0777-167236 |
| 08. | යූ.සාගරිකා සඳමාලී මහත්මිය | කර්මාන්ත සංවර්ධන නිලධාරී | 011-2804511 | 071-6928537 |
| 09. | බෝධන කසුන් කෝන්ගහවත්ත මහතා | පරිගණක දෘඩාංග ශිල්පී | 011-5515570 | 077-6724515 |

## 6. සියළු ප්‍රඥප්ති හා අණපනත්

1994 අංක 02 දරණ බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය මඟින් බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද අතර එහි සංශෝධනයක් මේ වන විට සිදුකර ඇත, නව පළාත් සභාවක් පිහිටුවනු ලැබීමත් සමඟම සංශෝධිත ප්‍රඥප්තිය සභාගත කොට ගැසට් කිරීමට නියමිතය.

පරිපාලන කටයුතු සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරී පරිපාලන කාර්ය පරිපාටි සංග්‍රහයද, එයින් ආවරණය නොවන කරුණු සඳහා ආයතන සංග්‍රහය හා විනය පරිපාටිය අනුගමනය කරනු ලබන අතර මූල්‍ය කටයුතු සඳහා පළාත් මූල්‍ය රෙගුලාසි අනුගමනය කරනු ලැබේ.

කර්මාන්ත සංවර්ධන අධිකාරිය බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ද පරිපාලන, මූල්‍ය හා සංවර්ධන කටයුතු සඳහා අනුගමනය කරනු ලැබේ.

මෙයට අමතරව වශයෙන් කාර්යාල සේවක අණපනත් වන 1958 අංක අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවා නියුක්තිකයිනගේ භාරකාර මණ්ඩල අණපනත්, 1983 අංක 12, 1990 අංක 41 දරන (සංශෝධන), 1992 අංක 62 දරන (සංශෝධන) පාරිතෝෂික ගෙවීමේ පනත හා 1954 අංක 64 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත යන අණපනත් අදාල කරගනු ලැබේ.

1994 අංක 02 දරණ බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව

---

# 1994 අංක 02 දරන බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය

---

(බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සටහන් කළේ 1994 අප්‍රේල් මස 07 වන දිනය)

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් මිළදී ගත හැක

මිළ : රු. 18.25 තැපැල් ගාස්තුව : රු. 2.00

අවශ්‍ය පර්යේෂණ පැවැත්වීම,

(ඊ) පළාත තුළ විවිධ කර්මාන්තකරුවන් අතරේ සුහදතාවය පවත්වාගෙන යෑම්,

(උ) දේශීය වශයෙන් නිපදවනු ලබන භාණ්ඩ සඳහා පළාත තුළ වෙළඳපොල ඇති කිරීම සහ එබඳු භාණ්ඩ නිෂ්පාදනය උනන්දුකරවීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස අභ්‍යන්තර ගිවිසුම් සඳහා විධිවිධාන සැලැස්වීම,

(ඌ) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ අලෙවි කිරීම පිණිස අවශ්‍ය සහාය සහ උපදෙස් ලබාදීම,

(එ) මෙම අංශය සංවර්ධනය කිරීම පිණිස, අවශ්‍ය මුදල් ලබා ගැනීම, තරඟ සහ තෑගි බෙදාදීමේ උත්සව පැවැත්වීම සහ සහතික නිකුත් කිරීම පිළිබඳව මඟ පෙන්වීම,

(ඒ) මෙම ප්‍රඥප්තියෙහි පරමාර්ථවලට අදාළ වෙනත් කටයුතුවල නිරතවීම,

(ඔ) අමාත්‍යවරයාගේ මතයට අනුව අධිකාරිය විසින් භාරගත යුතු වන වෙනත් සම්බන්ධිත කටයුතුවල නිරතවීම

අධිකාරියේ අරමුණු වන්නේය.

අධිකාරියේ බලතල.

6. අධිකාරියට පහත සඳහන් කාරණා සඳහා බලය තිබිය යුත්තේය—

(අ) කවර වූ හෝ නීතියකට යටත්ව චංචල සහ නිශ්චල දේපලවල සන්තකය ලබා ගැනීම, දැරීම, බදුදීම හෝ කුලියට ලබා ගැනීම, උකස් කිරීම හෝ වෙනත් ආකාරයකට සුදුස්සක් කිරීම,

(ආ) නීතියේ අදාළ විධිවිධානවලට අනුකූලව, කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීමට සැලැස්වීම,

(ඇ) අදාළ නීතියේ විධිවිධානයන්ට අනුකූල වන පරිදි අධිකාරියේ අරමුණුවලින් කවර වූ හෝ අරමුණක් ඉටුකර ගැනීම සඳහා හවුල් ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම,

(ඈ) අධිකාරිය විසින් සපයා දෙනු ලබන පහසුකම් සඳහා ගාස්තු හෝ කුලිය අයකර ගැනීම,

(ඉ) අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කිරීම, සේවයේ යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් අතරේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම හා මෙම කාර්යයන් සඳහා අවශ්‍ය වන ව්‍යවස්ථා සහ නියෝග පැනවීම සහ ක්‍රියාත්මක කිරීම,

(ඊ) කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට නිශ්චිත රාජකාරී පැවරීම සහ ඔවුන්ගේ කාර්ය සාධනය අගැයීම හා අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිකර්ම පියවර ගැනීම,

(උ) අධිකාරියේ ඉහත සඳහන් කවර වූ හෝ අරමුණක් සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන යන්ත්‍රසූත්‍ර, උපකරණ සහ වාහන, ආනයනය කිරීම මගින් හෝ වෙනත් ආකාරයකින් ලබා ගැනීම.

## II වන කොටස

### අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය

7. (1) අධිකාරිය ක්‍රියාත්මක කිරීමට සහ එහි කටයුතු පාලනය කිරීමට කළමනාකරණ මණ්ඩලයක් (මින්මතු "මණ්ඩලය" වශයෙන් හඳුන්වනු ලබන) තිබිය යුතු අතර එය නිල බලයෙන් පත් වූ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සහ පත්කරනු ලබන සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. කළමනාකරණ මණ්ඩලය.

(2) මණ්ඩලයට නිල බලයෙන් පත්වූ සාමාජිකයන් විය යුත්තේ,

(අ) පළාතේ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්,

(ආ) පළාතේ කර්මාන්ත අධ්‍යක්ෂ,
සහ

(ඇ) පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ය.

(3) ප්‍රධාන අමාත්‍යවරයාගේ අවසරය ඇතිව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පත්කළ සාමාජිකයන් හතරදෙනා විය යුත්තේ —

(අ) පළාතේ බැංකු ක්ෂේත්‍රයේ නියෝජිතයකු,

(ආ) පළාතේ පෞද්ගලික අංශයේ කර්මාන්ත ව්‍යාපාරිකයකු,

(ඇ) පළාතේ වාණිජ ආයතනයක නියෝජිතයෙකු, සහ

(ඈ) පළාතේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියෝජිතයෙකු.

(4) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක්කෙනෙකු, එහි සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

(5) කර්මාන්ත විෂය මෙන්ම කෘෂිකර්ම විෂයද සම්බන්ධයෙන් පළාතේ එකම අමාත්‍යාංශයක් කටයුතු කරන අවස්ථාවකදී, ප්‍රධාන අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කොට, නිල බලයෙන් පත්වන අතිරේක සාමාජිකයකු මණ්ඩලය සඳහා නම් කිරීමට අමාත්‍යවරයාට හැකි වන්නේය.

8. ඉල්ලා අස්වීම, මියයෑම, ඉවත් කරනු ලැබීම් හෝ වෙනත් හේතුවක් නිසා කලින් ධුරය හිස් කරනහොත් මිස පත්කළ සාමාජිකයකු අවුරුදු තුනක කාලයක් තම ධුරය දරන්නේය. පත්කළ සාමාජිකයකුගේ ධුර කාලය.

9. කාලය ඉකුත්වීම හේතුවෙන් ධුරය හිස් කරන පත්කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය. නැවත පත්කරනු ලැබීමට සාමාජිකයන්ට තිබිය යුතු සුදුසුකම්.

10. අමාත්‍යවරයා අමතන ලද ලියුමක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්වීමට පත්කළ සාමාජිකයෙකුට හැකි වන්නේය. සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

11. පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු, මණ්ඩලයේ පත්කළ සාමාජිකයකු වශයෙන් පත්වීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුසු විය යුත්තේය. නුසුදුසුකම්.

වැඩ බලන සාමාජිකයන් පත් කිරීම.

12. (1) අයහපත් සෞඛ්‍ය තත්ත්වය, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්යයන් ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වුවහොත්, ඔහු වෙනුවට සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම පිණිස, වෙනත් යම් තැනැත්තෙකු 07 වන වගන්තියට යටත්ව පත් කිරීමට අමාත්‍යවරයාට හැකි වන්නේය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති හේතු නිසා තම ධුරයේ කටයුතු කිරීමට සභාපතිවරයා අපොහොසත් වුවහොත්, ඔහු නොමැති කාලය තුළ සභාපති වෙනුවෙන් කටයුතු කිරීම පිණිස මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකි වන්නේය.

මණ්ඩලයේ රැස්වීම.

13. මණ්ඩලය මාසයකට එක් වරක්වත් රැස්විය යුතුය.

ගණපූරණය.

14. මණ්ඩලයේ කවර වූ හෝ රැස්වීමක ගණපූරණය හතර දෙනෙකු විය යුත්තේය.

මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය.

15. මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වලදී කටයුතු කිරීම සම්බන්ධයෙන් ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව, නියෝග මගින් මණ්ඩලය සඳහා ම වූ කාර්ය පටිපාටියක් සකස් කර ගැනීමට මණ්ඩලයට හැකි වන්නේය.

මණ්ඩලයේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසා යම් ක්‍රියාවක් අවලංගු නොවිය යුතුය.

16. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමේ දෝෂයක් පැවතීම යන හේතුව නිසා, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් අවලංගු හැටියට නොසැලකිය යුත්තේය.

පාරිශ්‍රමිකය.

17. මණ්ඩලයේ සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතුය.

අධිකාරියේ පොදු මුද්‍රාව.

18. (1) අධිකාරියේ පොදු මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන තැනැත්තෙකුගේ භාරයේ තිබිය යුතුය.

(2) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුගේ ඉදිරිපිටදී හැර, කිසිම සාධන පත්‍රයක හෝ වෙනත් ලියවිල්ලක අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් දෙදෙනාම එම සාධන පත්‍රය හෝ ලියවිල්ල අත්සන් කළ යුතුය.

(4) එකී ආකාරයට අධිකාරියේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රවල සහ ලියවිලිවල ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතුය.

මණ්ඩලය සතු බලතල.

19. මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ මගින් හෝ මණ්ඩලය වෙත කෙළින්ම වෙන්කර දෙනු ලැබුවා වූ හෝ පවරා දෙනු ලැබුවා වූ බලතල, කාර්යයන් හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ සපුරාලීමට අතිරේක

වශයෙන්, ප්‍රඥප්තියෙහි 6 වන වගන්තියේ හෝ වෙනත් විධිවිධානයක සඳහන් වන අධිකාරිය සතු බලතල කිසිවක් හෝ සියල්ලක්ම ක්‍රියාත්මක කිරීමේ බලය මණ්ඩලයට තිබිය යුතුය.

මණ්ඩලයේ කාර්යය.

20. (අ) (i) පළාත් සභාවේ හෝ පළාත් සභාවේ යම් අමාත්‍යාංශයක, හෝ

(ii) පළාතේ කරගෙන යනු ලබන හෝ කරගෙන යාමට තිබෙන යම් කර්මාන්තයක, හෝ

(iii) යම් පළාත් පාලන අධිකාරියක

යහපත තකා, මණ්ඩලයේ අරමුණු මගින් අපේක්ෂා කරනු ලබන සේවාවන් හැකි තරම් දුරට සපයා දීම,

(ආ) එහි අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය විය හැකි සියළු පියවර ගැනීම,

(ඇ) තමන්ගේ කැමැත්තෙන්ම හෝ අමාත්‍යවරයාගේ ඉල්ලීම මත හෝ, කර්මාන්ත ප්‍රවර්ධනයට සහ සංවර්ධනයට අදල සියළුම කාරණා පිළිබඳව ඔහුට උපදෙස් දීම

මණ්ඩලයේ කාර්යය විය යුතුය.

මණ්ඩලයේ බලතල, කාර්යයන් සහ කර්තව්‍ය පැවරීම.

21. (1) මෙම ප්‍රඥප්තිය යටතේ මණ්ඩලයට ඇති බලතල, කාර්යයන් සහ කර්තව්‍ය, මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ සේවකයකුට පවරාදීමට මණ්ඩලයට හැකි වන්නේය.

(2) බලතල, කාර්යයන් හෝ කර්තව්‍ය එසේ පවරා දෙනු ලැබ සිටින එබඳු යම් සාමාජිකයකු හෝ සේවකයකු ඒවා ක්‍රියාත්මක කළ යුත්තේ, සපුරාලිය යුත්තේ හෝ ඉටුකළ යුත්තේ මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්වය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයට කරනු ලබන විධානයන්.

22. (1) ස්වකීය බලතල, කාර්යයන් සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සපුරා ලීමේ දී සහ ඉටුකිරීමේ දී මණ්ඩලය, අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධානයන්ට යටත්විය යුතු අතර, ඒවාට අනුකූලව කටයුතු කළ යුත්තේය.

(2) වෙනත් අමාත්‍යවරයෙකුට පවරාදී ඇති කාර්යයන්ට බලපාන යම් කාරණයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් විධානයක් කිරීමේ දී අමාත්‍යවරයා එසේ කළ යුත්තේ එම අමාත්‍යවරයා සමග සාකච්ජා කිරීමෙන් අනතුරුවය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ආදිය.

23. මෙම ප්‍රඥප්තියේ සෙසු විධිවිධානයන්ට යටත්ව —

(අ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් සහ වෙනත් කොන්දේසි මත, යෝග්‍ය තැනැත්තෙකු, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද විය යුතු මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පූර්ණකාලීන පදනමක් මත පත්කිරීමට ද,

(ආ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත්කිරීමට, සේවයෙන් පහකිරීමට සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යැමට ද,

(ඇ) එම කාර්ය මණ්ඩලයේ වේතන, වැටුප් සහ වෙනත් පාරිශ්‍රමික නියම කිරීමට ද,

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි සහ නියමයන් තීරණය කිරීමට ද,

(ඉ) එම කාර්ය මණ්ඩලයේ යහපත උදෙසා අර්ථසාධක අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීමට හා පාලනය කිරීමට ද, සහ එම අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීමට ද මණ්ඩලයට හැකි වන්නේය.

## III වන කොටස

## මුදල් සහ ගිණුම්

කර්මාන්ත ගිණුම.

24. (1) පළාත් අරමුදල විෂයෙහි, (මෙහි මින්මතු "කර්මාන්ත ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන) "කර්මාන්ත සංවර්ධන ගිණුම" නම් වූ වෙනම ගිණුමක් ක්‍රියාත්මක කොට පවත්වා ගෙන යායුතු වන අතර, එම "කර්මාන්ත ගිණුම" පහත සඳහන් දෙයින් සමන්විත විය යුත්තේය —

(අ) පළාත් සභාව විසින් එයට වෙන්කර දෙනු ලබන අරමුදල්,

(ආ) අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් සඳහා ලැබෙන සියලුම ආදයම්,

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ අනුමැතිය ඇතිව අධිකාරියට ලැබෙන සියළුම ණය සහ විදේශ ආධාර, සහ

(ඈ) ස්වකීය කටයුතු වලින් අධිකාරියට ලැබෙන වෙනත් ආදයම්.

(2) කර්මාන්ත ගිණුම පවත්වා ගෙන යෑම සහ ක්‍රියාත්මක කිරීම, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වන පරිච්ඡේදයේ සඳහන් පළාත් අරමුදල සම්බන්ධ විධි විධානයන්ට යටත් විය යුත්තේය.

(3) (4) වන උපවගන්තියේ කාර්යයන් සඳහා මණ්ඩලයට කලින් කල අවශ්‍ය විය හැකි මුදල් ගණන් සියල්ලක්ම, පළාත් අරමුදලෙන් කර්මාන්ත ගිණුමට මාරු කළ යුතුය.

(4) මණ්ඩලය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේදී හෝ තම කාර්යයන් හෝ කර්තව්‍ය ඉටු කිරීමේදී හෝ සපුරාලීමේදී, මණ්ඩලයට දැරීමට සිදුවන කවර වූ හෝ වියදමක් ගෙවීම සඳහා අවශ්‍ය වන සියළුම මුදල් ගණන්, කර්මාන්ත ගිණුමෙන් ගෙවනු ලැබිය යුත්තේය.

අධිකාරියේ මුදල් වර්ෂය.

25. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුත්තේය.

අධිකාරියේ ගිණුම් විගණනය කිරීම.

26. (1) එක් එක් වර්ෂය සඳහා වූ අධිකාරියේ ගිණුම්, විගණනයට භාජනය කිරීම පිණිස අදාළ මුදල් වර්ෂය අවසාන වීමෙන් මාස හයක් ඉකුත් වීමට කලින්, විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම ගිණුම්, විගණනය කිරීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයාට සහාය වීමේ කාර්යය සඳහා, ඔහුගේ මෙහෙයවීම සහ පාලනය යටතේ කටයුතු කළ යුතු සුදුසුකම් ලත් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ සේවය ලබා ගැනීමට විගණකාධිපතිවරයාට හැකි වන්නේය.

(2) අධිකාරියේ ගිණුම් විගණනය කිරීමේදී විගණකාධිපතිවරයා විසින් දරනු ලබන වියදම පියවීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක්, අධිකාරියේ අරමුදල් වලින් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය යුතුය. අධිකාරියෙන් විගණකාධිපතිවරයාට ලැබුණු පාරිශ්‍රමිකය, එකී විගණනය සඳහා ඔහු විසින් සේවයට ගන්නා ලද යම් සුදුසුකම් ලත් විගණකවරයෙකුට ගෙවනු ලැබූ මුදල් අඩු කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(3) විගණකාධිපතිවරයාට සහ අධිකාරියේ ගිණුම් විගණනය කිරීමේදී ඔහුට සහාය වන යම් තැනැත්තෙකුට, විගණනයට අවශ්‍ය යයි විගණකාධිපතිවරයා සලකනු ලබන අධිකාරියේ සියලු පොත්පත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමට හිමිකම තිබිය යුතු අතර, මණ්ඩලය සහ එහි නිලධාරීන් විසින් එම කාර්යය සඳහා අවශ්‍ය විය හැකි, තමන්ට දැනගන්නට ලැබී ඇති තොරතුරු ඔවුන්ට ලබාදිය යුතුය.

(4) මෙම වගන්තියේ කාර්යය සඳහා සුදුසුකම් ලත් විගණකවරයා යන පාඨයෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක්, හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකුව සිටින්නේද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්, හෝ අදහස් වේ.

27. (1) විගණකාධිපතිවරයා විසින් අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට — විගණකාධිපතිවරයාගේ වාර්තාව.

(අ) තමාට අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් තමා විසින් ලබා ගෙන තිබේද නැද්ද යන බව සඳහන් කරමින්,

(ආ) වාර්තාවේ සඳහන් වන ගිණුම්, අධිකාරියේ කටයුතුවල සත්‍යවූත් සාධාරණවූත් තත්ත්වයක් විදහා දැක්වෙන පරිදි නිසි ලෙස සකස් කර තිබේද යන බව සඳහන් කරමින්, සහ

(ඇ) ඔහුගේ මතය අනුව, පළාත් සභාවට සම්බන්ධතාවක් ඇතැයි සැලකෙන ගිණුම්වල යම් යම් කොටස්, සහ අධිකාරියේ කටයුතු සහ ගිණුම් පිළිබඳ යම් පරීක්ෂණයක් ද කෙරෙහි අවධානය යොමු කරමින්

වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(2) විගණකාධිපතිවරයා විසින්, ස්වකීය වාර්තාව විගණනය කරන ලද ගිණුම් ද සමග, මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

විගණකාධිපතිගේ වාර්තාව සහ අධිකාරියේ වැඩකටයුතු පිළිබද වාර්ෂික වාර්තාව ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු බව.

28. එක් එක් අවුරුද්දේ, විගණනය කරන ලද ගිණුම් සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විට, මණ්ඩලයේ අධ්‍යක්ෂ විසින් එම වාර්තාව සහ එම ගිණුම්, අධිකාරියේ වැඩ කටයුතු පිළිබඳ ප්‍රකාශයද සමග ප්‍රධාන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු අතර, ප්‍රධාන අමාත්‍යවරයා විසින්, එහි පිටපත්, ගිණුම් අදාළ වන අධිකාරියේ මුදල් වර්ෂය අවසන් වීමෙන් මාස දොළහක් තුළ පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය යුතුය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

නියෝග.

29. (1) මෙම ප්‍රඥප්තියෙහි ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමේ සහ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහාද නියමකරනු ලැබීමට මෙම ප්‍රඥප්තිය මගින් නියමිත හෝ මේ පනතින් නියෝග අවශ්‍යවන නැතහොත් නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය පවරා ඇති සියළු කාරණා සඳහා ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැක්කේය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේදී හෝ එම නිවේදනයේ නියම කරනු ලබන පසුව එළඹෙන දිනයකදී බලාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසුව පහසුවෙන් කරනු ලැබිය හැකි වහාම, අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියට පත් කරනු ලැබිය යුත්තේය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එසේ අනුමත කරනු නොලැබූ දිනයේ සිට, එහෙත් එය යටතේ ඊට කලින් කරනු ලැබූ කිසිවකට හානියකින් තොරව පරිච්ඡින්න කරනු ලැබූ හැටියට සලකනු ලැබිය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ හැටියට සලකනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතුය.

මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩම්.

30. (1) පළාතේ පිහිටා ඇති යම් ඉඩමක් මෙම ප්‍රඥප්තියේ කිසියම් කාර්යයක් සඳහා අවශ්‍ය වන බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවකදී අමාත්‍යවරයාගේ නිර්දේශය මත, පළාත් සභාවේ රැස්වීමකදී සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතයක් මගින් පහත සඳහන් ආකාරයට කටයුතු කිරීමට පළාත් සභාවට හැකි වන්නේය.

(අ) ඉඩම රජයේ ඉඩමක් නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ II වන පරිශිෂ්ඨයේ 1:2

වන අංකය ප්‍රකාර, එකී කාරණය සඳහා එකී ඉඩම පළාත් සභාවට ලබා දෙන ලෙස ජනරජයේ ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කිරීම,

(ආ) ඉඩම පෞද්ගලික ඉඩමක් නම්, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ, පළාත් සභාව වෙනුවෙන් එකී කාර්යය සඳහා එකී ඉඩම අත්කර ගන්නා ලෙස අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කිරීම.

(2) පළාත් සභාව (1) වන උපවගන්තිය යටතේ යෝජනා සම්මතයක් කර ඇති අවස්ථාවකදී එකී කාර්යය සඳහා ඉඩම පළාත් සභාවට ලබා දෙන ලෙස ඉල්ලමින්,

(අ) යෝජනා සම්මතය අදාළ වන්නේ රජයේ ඉඩමකට නම් ජනරජයේ ජනාධිපතිවරයාගෙන්, හෝ

(ආ) යෝජනා සම්මතය අදාළ වන්නේ පෞද්ගලික ඉඩමකට නම් අමාත්‍ය මණ්ඩලයෙහි ඉඩම් විෂයය භාර ඇමතිවරයාගෙන්

නියම කරනු ලබන ආකෘති පත්‍රයක් මගින් ඉල්ලීමක් කිරීමට පළාත් සභාවට හැකි වන්නේය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම මත, අවස්ථාවට අදාළ පරිදි, ජනරජයේ ජනාධිපති හෝ අමාත්‍ය මණ්ඩලයෙහි ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා එකී ඉඩම පළාත් සභාවට ලබා දුන්නේ නම්, එසේ ඉඩම ලබා දෙන අවස්ථාවේදී, අවස්ථාවට අදාළ පරිදි ජනරජයේ ජනාධිපතිවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වන්දි ගෙවීම ඇතුළු නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, වෙනත් කාර්යයන් සඳහා නොව, එකී ඉඩම ඉල්ලන ලද්දේ යම් කාර්යයක් සඳහා ද එම කාර්යය සඳහාම පළාත් සභාව විසින් එකී ඉඩම උපයෝගී කර ගත යුතුය.

31. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය වන ආකාරයට, යම් රාජ්‍ය සංස්ථාවක්, සමාගමක් හෝ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් සමඟ, මෙම ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, එකී සියලුම කොන්ත්‍රාත්වලට සහ ගිවිසුම්වලට එළඹීමටත්, ඒවා සපුරාලීමට හෝ ක්‍රියාත්මක කිරීමටත් මණ්ඩලයට හැකි වන්නේය. යම් රාජ්‍ය සංස්ථාවක්, සමාගමක් ආදිය සමඟ ඇතිකර ගන්නා කොන්ත්‍රාත්තු.

32. මණ්ඩලයේ සියලුම නිලධාරීහු සහ සේවකයෝ, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථය තුළ සහ එහි කාර්යයන් සඳහා, රාජ්‍ය සේවකයන් හැටියට සලකනු ලැබිය යුත්තාහ. මණ්ඩලයේ සේවකයන් රාජ්‍ය සේවකයන් හැටියට සලකනු ලැබිය යුතු බව.

33. මණ්ඩලයේ යම් නිලධාරියකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේදී හෝ සපුරාලීමේදී නැතහොත් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී ඔහුට දැනගන්නට ලැබුණු කිසිම තොරතුරක්, ස්වකීය කර්තව්‍ය සපුරාලීමේ හෝ කාර්යයන් ඉටුකිරීමේ රහස්‍යභාවය.




හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්යය සඳහා අමාත්‍යවරයාට හැර වෙනත් යම් තැනැත්තෙකුට හෝ, යම් නීතියක් යටතේ අධිකරණයක්


7. ඉටු කරන ලද සේවාවන්, ක්‍රියාකාරකම්, විශේෂ වැඩසටහන්, ව්‍යාපෘති හා අත්කරගත් ජයග්‍රහණයන්

| | වැඩසටහන් පිළිබඳ ඡායාරූප | විස්තරය |
|---|---|---|
| **01.** | **රොටරි සමාජය හා කර්මාන්ත සංවර්ධන අධිකාරිය එක්ව බස්නාහිර පළාතේ සුළු කර්මාන්තකරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ස්වයං රැකියා උපකරණ ලබාදීම.**<br> | <u>**"දිරිය වනිතා ව්‍යාපෘතිය "**</u><br><br>බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා කොළඹ කොටුව හා මැද කොළඹ රොටරි සමාජය එක්ව කර්මාන්තකරුවන් දිරි ගැන්වීම සඳහා පවත්වනු ලබන වැඩසටහනකි.<br><br>කොළඹ දිස්ත්‍රික්කය තුළ කර්මාන්තයක යෙදෙන පුද්ගලයින් 27 ක් තෝරා ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. මොවුන් කරගෙන යනු ලබන කර්මාන්තය දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය ස්වයං රැකියා උපකරණ ලබා දිම තුලින් ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම , නව රැකියා අවස්ථා බිහි කිරිම, ගෘහස්ථ කර්මාන්ත සඳහා ගෘහණියන් පෙළඹවීම, පවුල් ඒකකය ශක්තිමත් කිරීම, පවුල් ඒකකයේ ආදායම වැඩි කිරිම තුලින් ජීවන තත්වය වැඩි දියුණු කිරීම හා දරුවන්ගේ අධ්‍යාපන තත්වය උසස්කරලීම මෙහි අපේක්ෂිත අරමුණු වේ. |
| 02. | **සන්සල අලෙවි පොල වෙළඳ කුටි ප්‍රදර්ශණය**<br> | <u>**සන්සල අලෙවි පොළ**</u><br><br>බස්නාහිර පළාත තුල වෙසෙන ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම, වෙළඳ පොළට හඳුන්වාදීම හා ඔවුන්ගේ ආර්ථික තත්වය නංවාලීම අරමුණු කරගෙන සෑම මාසයක ම දින 3 ක අලෙවි පොළක් බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේදී පැවැත්වේ. |
| **03** | <br><br>කර්මාන්ත ආයතන වෙත ගොස් පවතින ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම | <u>**කර්මාන්ත සංවර්ධන හා නවෝත්පාදන මධ්‍යස්ථානය(IDIC)**</u><br><br>බස්නාහිර පළාත් තුල සිටින ක්ෂුද්‍ර, සුළු හා මහාපරිමාණ කර්මාන්තකරුවන්ට සේවා සැපයීම මෙම මධ්‍යස්ථානයේ අරමුණ වි ඇති අතර නවෝත්පාදන සංකල්ප හඳුන්වා දිම හා නව ආකෘති නිර්මාණය කිරිම ඵලදායිතාව ඉහළ නැංවිම හා කාර්යක්ෂමතාවය වර්ධනයට උපදෙස් සැපයිම,අලෙවි අවස්ථා ලබා දිම, පරිසර හිතකාමි නවෝත්පාදන දිරිමත් කිරිම, කර්මාන්ත සම්බන්ධයෙන් පවතින ගැටළු සෘජුවම හෝ වක්‍රව විසදීම යන සෙසු අරමුණු පෙරදැරි කරගෙන මෙම ස්ථානය පවත්වාගෙන යනු ලබයි.<br><br>ප්‍රධාන වශයෙන්ම බස්නාහිර පළාත තුළ කර්මාන්තයක් කරගෙන යනු ලබන කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු සඳහා නොමිලේ උපදේශන සේවා සැපයීම මෙම මධ්‍යස්ථානය මගින් සිදු කරන අතර කර්මාන්ත ශාලාවල ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසු සහන ගාස්තු අය කිරීමක් |

| | | |
|---|---|---|
| |  <br>ක්ෂේත්‍ර චාරිකා අවස්ථා | යටතේ ගැටළු සඳහා අවශ්‍ය විසඳුම් සපයනු ලැබේ. |
| **04** | **විසිතුරු මසුන් ඇතිකිරීමේ පුහුණුව**<br> | **<u>විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>**<br>බස්නාහිර පළාත තුල වෙසෙන විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන කර්මාන්ත කරුවන් සඳහා විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩසටහන් ජාතික ජලජ පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය හා එක්ව පැවැත්වීම හා එමගින් විසිතුරු මසුන් ඇති කිරීම ස්වයං රැකියාවක් ලෙස පවත්වා ගෙන යනු ලබන කර්මාන්තකරුවන්ට එම ක්ෂේත්‍රය පිළිබඳ මනා පුහුණුවක් හා අවබෝධයක් ලබාදී ඔවුන්ගේ ආදායම් තත්වය නංවාලීම අපේක්ෂා කරන කරන අතර වෙළඳ පොල අවස්ථා ලබාදීමට කටයුතු කිරීම. |
| 05 | **ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීම**<br> | **<u>ඇසුරුම්කරණ වැඩසටහන් පැවැත්වීම</u>**<br>බස්නාහිර පළාත තුල පදිංචි කර්මාන්තකරුවන් නිෂ්පාදන වල අලෙවිය වර්ධනය සඳහා උපයෝගී වන භාණ්ඩ ඇසුරුම්කරණය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම. |


| | | |
|---|---|---|
| **06** | **මිනි ට්‍රක් රථය හඳුන්වා දීම**<br> | **<u>මිනි ට්‍රක් රථය හඳුන්වා දීම.</u>**<br><br>කර්මාන්ත සංවර්ධන අධිකාරිය ටොරෙන්ටො ආයතනය හා එක්ව බැටරියෙන් ක්‍රියා කරන මිනි ට්‍රක් රථය නිෂ්පාදනය කරන ලද අතර BMICH හි පැවති ඉන්කෝ ප්‍රදර්ශනයේදී මෙම මිනි ට්‍රක් රථය මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදී. දැනට පරිසර හිතකාමී නිෂ්පාදනයක් ලෙස පරීක්ෂන ධාවනය සඳහා යොදවා ඇත. |
| **07** | **Organic and Natural Product Expo –Dubai විදේශ වෙළඳ ප්‍රදර්ශණය සඳහා සහභාගී වූ අවස්ථාව**<br><br>  | **<u>කර්මාන්තකරුවන් විදේශ වෙළඳ ප්‍රදර්ශණ සඳහා සහභාගී කිරීම.</u>**<br><br>සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විදේශ වෙළඳපොළ සඳහා යොමු කිරීම, ඔවුන්ගේ නිෂ්පාදන විදේශ වෙළඳ පොලට හඳුන්වා දීම හා එමගින් අලෙවි හා විදේශ විනිමය ඉපැයීමේ අවස්ථාවන් ලබාදීම අරමුණු කර ගෙන මෑතකදී පැවැති **Organic and Natural Product Expo – Dubai** ප්‍රදර්ශනය සඳහා කර්මාන්තකරුවන් සහභාගී කරවීය.<br><br>ඉදිරියේදී පැවැත්වෙන මෙවන් විදේශ වෙළඳ ප්‍රදර්ශණ සඳහා කර්මාන්තකරුවන් සහභාගී කරවීමට අපේක්ෂා කෙරේ. |

<table>
<tr>
<td>08</td>
<td>ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ අවස්ථාවක්<br></td>
<td><u>ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන</u><br><br>බස්නාහිර පළාත තුල සිටින ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන හා දැනටමත් ව්‍යාපාරයක් ආරම්භ කර ඇතිව්‍යවසායකයින් සඳහා ඔවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම අරමුණු කරගෙන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.</td>
</tr>
<tr>
<td>09</td>
<td>සපයන ලද දැව නිෂ්පාදන<br></td>
<td><u>දැව භාණ්ඩ සැපයීම</u><br><br>රාජ්‍ය ආයතන හා පාසැල් වලට අවශ්‍ය දැව භාණ්ඩ සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.<br><br>දැව භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියුතු කර්මාන්තකරුවන් ගේ නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැපයීම හා එමගින් ඔවුන්ගේ ආදායම් තත්වය ඉහල නැංවීමත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙසත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.</td>
</tr>
<tr>
<td>10</td>
<td>IDA අභිමන් සගරාවේ මුල් හා පසු පිටුවල ඡායාරූප<br>
</td>
<td><u>IDA අභිමන් සගරාව</u><br><br>බස්නාහිර පලාතේ කර්මාන්තකරුවන්ගේ දැනුම, ආකල්ප සංවර්ධනය කිරීම හා අධිකාරියේ සේවා කර්මාන්තකරුවන් වෙත හඳුන්වාදීම සඳහා IDA අභිමන් සඟරාව වාර්ෂිකව පල කරනු ලැබේ.</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| **11** | **පාසැල් ඩෙස් පුටු අළුත්වැඩියා කිරීමේ අවස්ථාවක්**<br> | **<u>පාසැල් ඩෙස්පුටු අළුත්වැඩියා කිරීම</u>**<br><br>බස්නාහිර පළාත තුල පිහිටි පාසැල් වල කැඩීබිදී ගිය පැසැල් ඩෙස්පුටු අළුත්වැඩියා කිරීම3R සංකල්පයට අනුව සිදු කරයි.<br><br>දැනට මෙම ව්‍යාපෘතිය පළාත් සභා අරමුදල් හා පාසැල් සංවර්ධන සමිති මගින් ලබා දෙන ප්‍රතිපාදන වලින් සිදු කරනු ලැබේ. |
| **12** | වැඩ සටහන් සඳහා සහභාගී වූ පිරිසක්<br> | **<u>ආනයන අපනයන ක්‍රියාවලිය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම</u>**<br><br>බස්නාහිර පළාත තුල පදිංචි කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන විදේශ වෙළද පොලට ඉදිරිපත් කිරීම හා එමගින් විදේශ විනිමය උපයා ගැනීම පිළිබද කර්මාන්තකරුවන් දැනුවත් කිරීම අරමුණු කරගෙන මෙම වැඩසටහන පවත්වනු ලැබේ. |
| 13 | **වාර්තා විශ්ලේෂනය කල හැකි අයුරු දැක්වෙන සටහනක්**<br> | **<u>බස්නාහිර පළාතේ කර්මාන්තකරුවන්ගේ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම</u>**<br><br>බස්නාහිර පළාත තුල සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්තකරුවන් තොරතුරු රැස්කර කර්මාන්තකරුවන්ගේ දත්ත බැංකුව ස්ථාපිත කිරීම අඛණ්ඩව සිදු කරයි. මෙම කාර්ය විශේෂ පරිගණක නිර්මානයක් මගින් සිදු කරන අතර මෙමගින් පහත සඳහන් ආකාරයට පළාතේ කර්මාන්තකරුවන්ගේ විස්තර වාර්තා ලබා ගැනීමට හැකියාව ඇත.<br><br>1. ක්ෂුද්‍ර,සුළු,මධ්‍ය හා මහා පරිමාණ<br>2. නිෂ්පාදනය කරන භාණ්ඩ වර්ග අනුව<br>3. පළාත,දිස්ත්‍රික්කය,ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී කොට්ඨාශය වශයෙන්<br>4. ස්ත්‍රී පුරුෂ භාවය අනුව<br>5. සැපයුම් කරන වෙළඳ පොල අනුව (දේශීය/විදේශීය) |
| **14** | | **<u>ස්වයං රැකියා උපකරණ බෙදාදීම</u>**<br><br>බස්නාහිර පළාත තුල සිටින කර්මාන්තකරුවන්ගේ |

<table>
<tr>
<td></td>
<td>
</td>
<td>ආදායම් තත්යව වැඩි දියුණු කිරීම සදහා උපමාන පාදක පාදක ප්‍රදාන හා පලාත් සංවර්ධන ප්‍රදාන යටතේ ස්වයං රැකියා උපකරණ බෙදාදීමේ ව්‍යාපෘති කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් අඛණ්ඩව සිදු කරයි.</td>
</tr>
<tr>
<td>15</td>
<td>බැංකු නියෝජිතයින් සමග මූල්‍ය පහසුකම් ලබාදීම පිළිබද දැනුවත් කිරිම<br>
</td>
<td><u>කර්මාන්තකරුවන් වෙත මූල්‍ය පහසුකමු ලබාදීම</u><br><br>බස්නාහිර පළාත තුල සිටින කර්මාන්තකරුවන්ට අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය ලබාදීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික බැංකු සමග ඒකාබද්ධව සහන පොලී අනුපාතයන් යටතේ මූල්‍ය පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි.<br><br>කර්මාන්ත කරුවන් පිළිබද තොරතුරු නිර්දේශ කර බැංකුව වෙත ඉදිරිපත් කිරීම හා ව්‍යාපාති වාර්තා සකස් කිරීම මෙහිදී අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයවේ.</td>
</tr>
<tr>
<td>16</td>
<td>ලියාපදිංචි වන කර්මාන්තකරුවන් වෙත ලබා දෙන සහතිකය<br>
Certificate of Industrial Registration
Industrial Development Authority
(Western Province)
This is to certify that
Mr./Ms. ______ of ______
Situated at ______
in ______ Grama Niladari Division in ______ Divisional Secretariat Division
District of ______ Registered in the Industrial Development Authority (W.P.)
Period of Registration from ______ To ______
Business Registration No. ______
Chairman
Director/CEO
I.D.A. Registration No. ______
Date ______</td>
<td><u>කර්මාන්තකරුවන් ලියාපදිංචි කිරීම</u><br><br>බස්නාහිර පළාත තුල සිටින කර්මාන්ත.කරුවන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීම තුලින් ඔවුන් සඳහා ලියාපදිංචි සහතිකයක් හා හැදුනුම්පතක් නිකුත් කිරීම මගින් ඔවුන්ට ක්ෂේත්‍ර යේ පිළිගැනීමක් ලබාදීමත් එමගින් ඔවුන්ගේ නිෂ්පාදන වෙළද පොළට හඳුන්වා දීමට හා අලෙවියට පහසුකම් ලබාදීමත් මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ<br><br>කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් කර්මාන්තකරුවන් වෙත සේවා සැපයීමේදී ලියාපදිංචි කර්මාන්තකරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදීමක් සිදුකරන අතර මෙය ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මකවේ.</td>
</tr>
<tr>
<td>17</td>
<td>බෙදා දෙන ලද අත් ට්‍රැක්ටර් යන්ත්‍ර</td>
<td><u>අත් ට්‍රැක්ටර් බෙදාදීම</u><br><br>බස්නාහිර පළාත තුල පිහිටුවා කෘෂි බෝග වගාවේ යෙදෙන ගොවි ජනතාවගේ කෘෂිකාර්මික නිෂ්පාදන දියුණු කිරීම සඳහා සහ එමගින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇතිකිරීම අරමුණු කර ගෙන බස්නාහිර පළාත තුල පිහිටුවා ඇති ගොවි</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| |  | සංවිධාන සදහා අත් ට්‍රැක්ටර් බෙදා දීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරන ලදී. |
| 18 | **විශ්‍රාම වැටුප් සාමාජිකත්වය පිරිනැමීම**<br> | **<u>දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හදුන්වා දිම</u>**<br><br>විශේෂයෙන්ම ක්ෂුද්‍ර ,සුළු හා පරිමාණ කර්මාන්තකරුවන්ගේ ජීවන රටාව සැලකිල්ලට ගැනීමේ දි වැඩි පිරිසක් දෛනික ජීවන රටාවකට නැඹුරු වි ඇති අතර සැලකිය යුතු ප්‍රතිශතයක් එදිනෙදා වියදම් බවට පත්වන බැවින් අනාගත ආයෝජන සදහා නැඹුරුවක් දක්නට නොලැබි ඇත. එනිසා ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය සහ ජොෂ්ඨ පුරවැසි සමය සුරක්ෂිත කිරිම සදහා කර්මාන්ත අධිකාරිය සහ සමාජ ආරක්ෂණ මණ්ඩලය ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවති. |
| **19** | **පරිගණක අළුත්වැඩියා කිරීම**<br> | **<u>පරිගණක නඩත්තු හා සේවා සැපයීම</u>**<br><br>කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේ පිහිටුවා ඇති “අයිඩා කොම්”(IDACOM) පරිගණක ඒකකය මගින් බස්නාහිර පළාතේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා පාසල් වල පරිගණක සේවා කිරීම හා පරිගණක උපාංග ලබාදීම සිදු කරනු ලබයි. දැනට පළාත් සභාව තුල රාජ්‍ය ආයතන 14 කත්, විශාඛා විද්‍යාලයේත්, මධ්‍යම රජයේ පළාත් සභා හා පළාත් පාළන අමාත්‍යංශයේත් මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වේ. |

| | | |
|---|---|---|
| 20 | ව්‍යාපෘති වාර්තාවේ මුල් පිටුව<br><br> | <u>**ආදායම් උත්පාදන ව්‍යාපෘති**</u><br><br>කර්මාන්ත සංවර්දන අධිකාරිය හා විදේශ ආයෝජකයෙකු ඒකාබද්ධව දේශීය හා විදේශීය ආයෝජකයින් සම්බන්ධ කර ගනිමින් ලංකාවේ පාසැල් හා රජයේ ආයතන වල නිල ඇඳුම් අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය රෙදි නිෂ්පාදනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කිරීමට බලාපොරොත්තු වේ.<br><br>මේ සඳහා අවශය අනුමැතිය ඉදිරි වර්ෂයේදි කඩිනමින් ලබා ගැනීමට අදහස් කරන අතර ඉන් අනතුරුවදේශිය හා විදේශීය කර්මාන්තකරුවන් සම්බන්ධකර ගනිමින් අදාල කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අතර මෙමගි න් අධිකාරිය ස්වයං මූල්‍ය තත්වයට පත් කිරීමට අපේක්ෂා කෙරේ. |
| **21** |  | **ගම්මාන සංවර්ධනය**<br><br>**බස්නාහිර පළාතේ එක් එක් ප්‍රදේශ වල පදිංචි කර්මාන්තකරුවන් විසින් තමාගේ ජීවනෝපාය ලෙස සිදු කරන නිෂ්පාදන සහිත ගම්මාන වල එම වෘත්තිකයින්ගේ අභිවෘද්ධිය සඳහා ඔවුන්ට අවශ්‍ය දැනුම තාක්ෂණය . අලෙවි පහසුකම්, ආකල්ප සංවර්ධනය, යන්ත්‍ර සූත්‍ර ලබාදීම සහ ක්ෂේත්‍රයට අදාලව විවිධ වූ වැඩසටහන් මගින් එම වෘත්තීන් වල යෙදී සිටින ව්‍යවසායකයින් සවිබල ගන්වමින් ඔවුන්ගේ ආර්ථික ශක්තිය වැඩි දියුණු කරලීම සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. මෑතකදී අප විසින් සංවර්ධනය කරන ලද ගම්මාන ලෙස ගම්පහ, යක්කල ගොරකදෙණිය රත්‍රං බඩු නිෂ්පාදන ගම්මානය සහ කළුතර, වස්කඩුව කොහු ගම්මානය හැඳින්විය හැකිය.** |
| **22** | <br>ළමා පන්ති කාමරය | **මාදිවෙල ශ්‍රී රාහුල මහා විද්‍යාලය සඳහා භාණ්ඩ සැපයීම.**<br>**බස්නාහිර පළාතේ මාදිවෙල පිහිටි මාදිවෙල ශ්‍රී රාහුල විද්‍යාලය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ එම විද්‍යාලයට අවශ්‍ය ලී බඩු සහ අනෙකුත් පාසැල් උපකරණ සැපයීම සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලදී. මෙය පළාත් අධ්‍යපන දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය වෙත ලබා දෙන ලද ව්‍යාපාතියකි. ඒ ැනුව මෙම ව්‍යාපෘතිය යටතේ මාදිවෙල ශ්‍රී රාහුල විද්‍යාලය වෙත පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.**<br><br>**1.සියළුම ලීබඩු උපකරණ සැපයීම** |





සුහුරු පන්ති කාමරය සෙල්ලම් මිදුල





ගුරු විවේකාගාරය විදුහල්පති කාමරය



ගණිතාගාරය

1. ළමා පන්ති කාමර සදහා
2. විද්‍යාගාරය
3. පරිගණක කාමරය
4 සුහුරු පන්ති කාමරය
5 විදුහල්පති කාමරය
6 ගුරු විවේකාගාරය

2 . තිර රෙදි සැපයීම

1. විදුහල්පති කාමරය
2. පරිගණක කාමරය
3. සුහුරු පන්ති කාමරය
4. විද්‍යාගාරය

3. භාණ්ඩ සැපයීම

1. විද්‍යාගාර උපකරණ
2. ගෘහවිද්‍යාගාර උපකරණ
3. ගණිතාගාර උපකරණ

4. පරිගණක ලබාදීම
5. ස්මාර්ට් රූපවාහිනී ලබාදීම
6. Mini Note Book ලබාදීම
7. UPS ලබාදීම
8. සෙල්ලම් මිදුල මිලදී ගැනීම හා සවි කිරීම

## තාක්ෂණික පුහුණු වැඩසටහන්

බස්නාහිර පළාත තුල සෙසෙන ස්වයං රැකියාවක නිරතවීමට අපේක්ෂා කරන හා දැනට ස්වයං රැකියාවක නිරතව සිටින දැනුම වර්ධනය කර ගැනීමට අවශ්‍ය කර්මාන්තකරුවන් සඳහා විවිධ ක්ෂේත්‍ර යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරයි.

මේ යටතේ පාවහන් නිෂ්පාදනය, බෑග් නිෂ්පාදනය, බිම්මල් වගා කිරීම, ඇඳුම් මැසීම, විසිතුරු මසුන් ඇති කිරීම, ආහාර නිෂ්පාදන (ජෑම් ,කෝඩියෙල් නිෂ්පාදනය/ ආහාර කල්තබා ගැනීම/ විජලනය කිරීම) යන ක්ෂේත්‍ර වල පුහුණුව ලබාදීමට කටයුතු සලසා ඇත.

### බෑග් නිෂ්පාදනය



නිෂ්පාදනය කරන ලද බෑග් කීපයක්



ප්‍රායෝගික දැනුම ලබාදීමේ අවස්ථාවක්

### පාවහන් නිෂ්පාදනය





පුහුණුලාභීන් විසින් පාවහන් නිෂ්පාදනය කරනු ලබන අවස්ථා

**තිර රෙදි නිෂ්පාදනය**

**ඇඳුම් මැසීම**



**දැනුම ලබා දෙන අවස්ථාවක්**



**නිෂ්පාදනය කරන ලද ඇඳුම් කීපයක්**

## ඉදිකිරීම් හා සේවා සැපයීම

බස්නාහිර පළාත තුල පවතින ඉදිකිරීම් ක්ෂේත්‍ර යේ සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත සංවර්ධනය කිරීම හා කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙසමෙය ක්‍රියාත්මක කෙරේ. ගේ ආදායම් තත්වය නංවාලිම අරමුණු කරගනිමින් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

බස්නාහිර පළාත තුල ඇති රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල පහත සඳහන් ඉදි කිරීම් සේවා සිදුකරනු ලැබේ.

1. යකඩ හා ලි වැඩ
2. ඇලුමිණියම් පාටිෂන් හා දොර ජැනෙල් සවි කිරීම
3. සියලුම ගොඩනැගිලි නඩත්තු කටයුතු
4. මාර්ග ඉදිකිරීම හා සංවර්ධනය කිරිම (කොන්ක්‍රීට් බිම් ඇතුරුම් ගල් හා කාපට්)
5. තිර රෙදි හා අභ්‍යන්තර අලංකරණ කටයුතු
6. ජල නල ආශ්‍රිත නඩත්තු කටයුතු
7. විදුලි ක්ෂේත්‍රයට අදාල නව්‍යකරණ කටයුතු
8. වායු සමීකරණ නඩත්තු කටයුතු
9. සුළු වාරි ව්‍යාපෘති ඉදිකිරීම් හා නඩත්තු



අළුත්වැඩියා කටයුතු නිම කරන ලද ගොඩනැගිල්ලක්



අඹේපුස්ස පුහුණු මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම



මාර්ගය කාපට් කරන අවස්ථාවක්



කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් නිල නිවස ඉදිකිරීම



මාවල්ගම කෘෂි මාර්ගය පැති බැම්ම සකස් කිරීම



මත්තේගොඩ වැව පිළිසකර කිරීම



කෘෂි මාර්ග කොන්ක්‍රීට් කිරිම

## IDA ජයමග රූපවාහිනී වාර්තාමය වැඩසටහන

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්දන අධිකාරිය මගින් පළාතේ කර්මාන්තකරුවන් වෙත ලබා දෙන ලද සේවාවන් තවදුරටත් ජනතාව වෙත රැගෙන යැමමෙන්ම අප ආයතනයේ සේවාවන් ලබා ගෙන ඇගයීමටත් විදේශ වෙළඳ පොළ අපනයනය කරන කර්මාන්තකරුවන් දිරිගැන්වීමටත්,කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය නවෝත්පාදන විසඳුම් ලබාදීම යනාදී කරුණු පෙරදැරි කරගෙන ජාතික නාලිකාවක් මගින් විකාශය කිරීමට අවශ්‍ය රූගත කිරීම් සිදු කරන ලද අතර ඉදිරියේදී අනුග්‍රහ භවතුන්ගේ මූල්‍ය පහසුකම් ලබාගෙන විකාශය කිරීමට නියමිතය.

## 08. අත්කරගත් ජයග්‍රාහණයන්

**2014** **වර්ෂයේ පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, ධීවර සහ කර්මාන්ත අමාත්‍යාංශය විසින් සංවිධාන කරන ලද ඵලදායිතා තරඟාවලියේදී කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් C**
**කුසලතා සම්මානයක් දිනා ගන්නා ලදි.**

**2018** **වර්ෂයේ පළාත් සභාව තුල ව්‍යවස්ථාපිත ආයතන අතුරින් හොඳම වෙබ් අඩවියට හිමි සම්මානය දිනා ගැනීම.**



**9. හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්**

- ආදායම් උත්පාදනය සඳහා ක්‍රමෝපායක් සැකසීම.
- ප්‍රඥප්තියේ සංශෝධන සඳහා නිර්දේශ සැපයීම.
- කර්මාන්ත ලියාපදිංචිය සඳහා අධිකාරියට බලය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කිරීම.
- ප්‍රතිඵල පාදක කර ගත් ඇගයීම් ක්‍රමයක් අනුගමනය කර ගෙන පසුවිපරම් ක්‍රියාවලියක් සඳහා අවතීර්ණ වීම.

**2020 ක්‍රියාත්මක කිරිමට යෝජිත ව්‍යාපෘති**

බස්නාහිර පළාත තුල විසිරී සිටින ක්ෂුද්‍ර , සුළු හා මහා පරිමාන කර්මාන්තකරුවන්ගේ සංවර්ධනය,ප්‍රවර්ධනය,ව්‍යාපිතිය,හා දිරිගැන්වීම අරමුණු කොට ගෙන 2020 වර්ෂය සඳහා පහත සඳහන් ව්‍යාපෘති වාර්තා සකස් කොට කර්මාන්ත අමාත්‍යාංශය හා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ලබාදී ඇත.

| | ව්‍යාපාතිය | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| 1 | බස්නාශිර පළාත තුල භාණ්ඩ ඇසුරුම් කරණය පිළිබඳ වැඩ සටහන් පැවැත්වීම | 110,000.00 |
| 2 | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා GMP සහතික ලබාදීම. | 741,500.00 |
| 3 | පළාත තුල ක්ෂුද්‍ර කර්මාන්තකරුවන් 100 ක් ගොඩනැගීම හා සංවර්ධනය කිරීම. | 72,661,675.00 |
| 4 | කර්මාන්තකරුවන් සඳහා ආනයන අපනයන ක්‍රියාවලිය සඳහාවැඩසටහන් පැවැත්වීම. | 160,250.00 |
| 5 | පළාත තුල ස්භාවික අමු ද්‍රව්‍ය යොදා ගෙන පරිසර හිතකාමී නිෂ්පාදන කරනු ලබන කර්මාන්තකරුවන් දිරිගැන්වීම (රු.128,000.00) | 128,000.00 |
| 6 | කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයක් සංවර්ධනය කිරීම. | 2,600,000.00 |
| 7 | පළාතේ කර්මාන්තකරුවන් ඇගයීමේ උළෙලක් සංවිධානය කිරීම | 2,705,000.00 |
| 8 | ජාත්‍යන්තර වෙළඳ පොලට කර්මාන්තකරුවන් සහභාගීකරවීම. | 2,000,000.00 |
| 9 | ව්‍යාවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 412,255.00 |
| 10 | බස්නාහිර පළාතේ පාසැල්වල ඩෙස් පුටු අළුත්වැඩියා කිරීම | 6,076,087.00 |
| 11 | බස්නාහිර පළාතේ කර්මාන්තකරුවන්ගේ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම | 305,000.00 |